மாகாண பொதுச்சேவை ஆணைக்குழு, வடக்கு மாகாணம்.

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත.

**PROVINCIAL PUBLIC SERVICE COMMISSION, NORTHERN PROVINCE.**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No | **NP/07/10/02/Gen/2022** | |
| ඔබේ අංකය / உமது இல / Your No | | |
| දිනය / திகதி / Date | **2022.04.29** | |

**<u>පරිවර්තනය</u>**

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
උතුරු පළාත.

**<u>උතුරු පළාත් රාජ්‍ය සේවයේ නියුතු සියළුම නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම</u>**

ශ්‍රීර්ෂගත මැය හා සබැඳේ,

උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් පවත්වනු ලැබූ සියළුම කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්ට අදාල චක්‍රලේඛ අදාල නිලධාරින් දැනුවත් කිරීම සඳහා සියළුම කාර්යාල වෙත දෘඩ පිටපත් යොමු කිරීමට මේ දක්වා කටයුතු කරන ලදී.

නමුත්, **2022**.04.30වන දිනෙන් පසු අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වූ චක්‍රලේඛ හෝ / එම චක්‍රලේකයන්හි සංශෝධනයන් සම්බන්ධ දෘඩ පිටපත් යොමු නොකිරීමට පියවර ගෙන ඇති බව දන්වා සිටින අතර එම තොරතුරු www.np.gov.lk යන උතුරු පළාත් සභාවේ අන්තර්ජාලය මගින් පමණක් දත්තගත කරන බව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි..

එබැවින් අයදුම්කරුවන් එම අන්තර්ජාලය මගින් කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා ඊට අදාල අයදුම්පත් බාගතකර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශය සමග අදාල ශ්‍රේණියට පත් කරන ලද/උසස් කරන ලද ලිපියේ පිටපතක් සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම මෙම කාර්යාලයේ ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුයි..

***<u>සැ.යු</u>*** :- අදාල තනතුරට පත් කරන ලද / තනතුරු උසස් කරන ලද ලිපියේ පිටපත අයදුම්පත සමග අමුණා නියම කරන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථමයෙන් යොමු නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ඉල්ලීමක් පිළිබඳ සැලකිල්ලක් නොදක්වනු ලැබේ. (2022.06.01දින සිට මෙය ක්‍රියාත්මක වන අතර ඉහත අන්තර්ජාලයේ ලිපිනය මගින් නිකුත් කරන සියළුම කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වූ චක්‍රලේඛයන්ට මෙම කටයුතු අදාල වේ.)


(පිළිතුරු සපයන විට මගේ යොමු අංකය සඳහන් කිරීමට කාරුණික වන්න/ தயவு செய்து எனது தொடர்பு இலக்கத்தை தங்களது பதிற் கடிதத்தில் குறிப்பிடவும்/ Please indicate my reference No. in your reply)

Secretary : 021-2219980
Asst. Secretary : 021-205 4190
A/O : 021-221 9938
Office : 021-2219981
Exam Unit : 021-221 9939

இல. 393/48,கோவில் வீதி,நல்லூர்,யாழ்ப்பாணம்.
අංකය393/ 48,කෝවිල්පාර,නල්ලූර්,යාපනය.
No. 393/48, Temple Road, Nallur, Jaffna.

web : www.np.gov.lk
e-mail :admppscnp@gmail.com
exampppscnp@gmail.com
finppscnp@gmail.com

එමෙන්ම යම්කිසි තනතුරකට අදාල පත්වීම/තනතුරු උසස්වීම් ලිපිය රහිතව එම තනතුරට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම් කිරීම නිවරද්‍ය නොවන බව සැලකිල්ලට ගනු ලැබේ. එවැනි අයදුම්පත්‍ර නිර්දේශ කිරීමෙන් වළකින ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කාරුණිකව අවධාරණය කරනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණද එම පත්වීම් / තනතුරු උසස්වීම් ලිපි ප්‍රදානය නොකළ හේතුවෙන් එම විභාගයට අයදුම්කළ නොහැකි තත්වයක් තිබේ නම් එම කරුණු සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු ආකාරයකින් වගනොව බව සැලකිල්ලට ගත යුතුයි.

නිකුත් කරනු ලබන චක්‍රලේඛ උතුරු පළාත් සභාවේ අන්තර්ජාලයට පහත සඳහන් පරිදි ප්‍රවේශ වී ලබාගත හැකිය.

www.np.gov.lk ⟶ Exams & Recruitments ⟶ Advertisement

ඉහත කරුණු ඔබගේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු /කාර්යාලයන් හි සේවයේ නියුතු සියළුම නිලධාරීන් හා නිලධාරිනියන් වෙත දැනුවත් කර අන්තර්ජාලයේ ඉහත කොටස අප්ඩේට් කර මෙම කාරණාව සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලක් දැක්වීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

*ස. තිරුවාකරන්,*
*ලේකම් .*

(පිළිතුරු සපයන විට මගේ යොමු අංකය සඳහන් කරන්න/ தயவு செய்து எனது தொடர்பு இலக்கத்தை தங்களது பதிற் கடிதத்தில் குறிப்பிடவும்/ Please indicate my reference No. in your reply)

Secretary : 021-2219980
Asst. Secretary : 021-205 4190
A/O : 021-221 9938
Office : 021-2219981
Exam Unit : 021-221 9939
Fax No : 021-221 9940

இல. 393/48.கோவில் வீதி.நல்லூர்,யாழ்ப்பாணம்.
අංකය393/ 48,කෝවිල්පාර,නල්ලූර්,යාපනය.
No. 393/48, Temple Road, Nallur, Jaffna.

web : www.np.gov.lk
e-mail :admppscnp@gmail.com
exampppscnp@gmail.com
finppscnp@gmail.com